# සීමාසහිත ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය

# තනතුරු ඇබෑර්තු

**සීමාසහිත ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ** පුරප්පාඩුවී ඇති තනතුර සඳහා සුදුසුකම්ලත් ගම්පහ දිස්ත්‍රික්කයේ වසර 02 ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2024-12-10 දින සිට 2024 12-27 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීමේදී . සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 1.2.2 වගන්තිය අනුව සමිතියේ අභ්‍යන්තර සේවකයින්හට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

| තනතුර | වැ.ප අංකහ හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | 102 : 4 (III ශ්‍රේණිය) | 01 | 39,704-1,250X10-1,400X10-1,650X5-74,454/-. |

02. මෙම තනතුර ස්ථිරය. සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

03. **බඳවා ගැනීමේ සුදුසුකම්**

අ. 102:4 වැටුප් පරිමාණයේ බැංකු/මූල්‍ය ස්ථිර තනතුරක වසර දෙක (02) කට හෝ 102:5 වැටුප් පරිමාණයේ බැංකු/මූල්‍ය ස්ථිර තනතුරක වසර තුන (03) කට හෝ 102:6 වැටුප් පරිමාණයේ බැංකු/මූල්‍ය ස්ථිර තනතුරක වසර පහ (05) කට හෝ නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ. තනතුරේ ක්ෂේත්‍රයට අදාළ වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සමුපකාර ඩිප්ලෝමාවක් සමග 103:7 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ඇ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය සහතිකය හෝ ආවසරික II සහතිකය ලබා තිබීම හෝ සමග පිළිගත් ආයතනයක මූල්‍ය/බැංකු ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර තුන (03) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ඈ. පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජ විෂය ධාරාවේ උපාධියක් හෝ උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමාව හෝ සමග පිළිගත් ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර දෙක (02) කට නොඅඩු අධීක්ෂණ මට්ටමේ හෝ ඊට ඉහළ තනතුරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

04. **වයස් සීමාව** - අවුරුදු 26 - 45 ( අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ) සමුපකාර ක්ෂේත්‍රයේ ස්ථිර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපාතු ලබයි.

05. **බඳවා ගැනීමේ ක්‍රමය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

06. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදිව තොරතුරු සැපයිය යුතු අතර, බඳවාගැනීමේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත හෝ ලබා දී ඇති පත්වීම අවලංගු කළ හැකිය.

07. වෙනත් සමුපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයෙකු අයදුම්පත් යොමු කරන්නේ නම් තම අයදුම්පත අයදුම්කරු දැනට සේවය කරන සමිතිය හරහාම එවිය යුතුවේ. වෙනත් සමිතියක සේවකයෙකු ඍජුවම ඉදිරිපත් කර ඇති අයදුම්පත් කිසිදු හේතුවක් නිසාවත් සළකා බලනු නොලැබේ.

08. **අයදුම්පත්‍රය යොමුකිරීම**

I. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"සී/ස ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර සඳහා බඳවා ගැනීම"** යන්න සඳහන් කළ යුතුය.

II. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2024-12-27 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය. (අතින් ගෙනවිත් භාරදීමට ද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සී/ස ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය,**
**471/16, CRB පටුමග, කොළඹ පාර, ගම්පහ.**

**දුරකථන** : 033-2222706 / 2222139 /2224195
**විද්‍යුත් තැපෑල** : crbugq@gmail.com

**2024-12-10 දින දිය.**
**සීමාසහිත ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය.**